# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2007

ප්‍රසාංගික කලා -PART.E1015

ප්‍රසාංගික කලා පිළිබඳ හැඳින්වීමක්

<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

01. වර්තමානයේ 'ප්‍රසාංගික කලා' වශයෙන් හඳුන්වනු ලබන්නේ කුමන කලාවන් ද? එසේ හැඳින්වීමට ඔබ උපයෝගී කර ගන්නා නිර්ණායක කවරේදැයි පැහැදිලිව දක්වන්න.

02. දේශීය ගැමි යාතුකර්ම ප්‍රසාංගික කලාවක් වශයෙන් සැලකිය හැකිදැයි විමර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

03. ප්‍රසංගයක් වේදිකාගත කිරීම දක්වා දායකවන ශිල්පීන්ගේ කාර්ය භාරය හා වගකීම් පිළිබඳ ගුණාත්මක විශ්ලේෂණයක් කරන්න.

04. ගෘහස්ත වේදිකාවක පවත්වන ප්‍රසංගයක් හා එළිමහන් වේදිකාවක පවත්වන ප්‍රසංගයක දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටීන් හි වෙනස්කම් පැහැදිලිව දක්වන්න.

05. වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රසාංගික කලා අතුරින් වඩාත් ජනප්‍රියත්වයට පත්ව ඇත්තේ කුමන කලාවක්ද? එසේ වීමට තුඩු දී ඇති හේතු ශීර්ෂ 05 ක් යටතේ පමණක් සාකච්ඡා කරන්න.

06. ශ්‍රී ලංකාව හැර, ලෝකයේ සෙසු රටවල ප්‍රසාංගික කලාවන් ගේ වර්තමාන ප්‍රවණතා නිදසුන් සහිතව දක්වන්න.

07. නූතන තාක්ෂණික මෙවලම් ප්‍රසාංගික කලාවන් හී ගුණාත්මක වර්ධනයට හේතු කාරක වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

08. ප්‍රසාංගික කලාවන්ට අදාළව 'ප්‍රේක්ෂක තෘප්තිය' ට හිමිවන වැදගත්කම පිළිබඳ විමර්ශනයක් කරන්න.

************************